# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

1976 දෙසැම්බර් මස 31 වන දින

II වන කොටස

## අතිරේකය

(77. 01. 10 දින නිකුත් කරන ලදී.)


# නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

නිවාස හා ගොඩනැගිලි අමාත්‍යවරයාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

## නීතිය බලපෑමේ ප්‍රකාශය

මේ පනත් කෙටුම්පතේ නීතිය බලපෑම වනුයේ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය—

(අ) ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස නිවාසයක් ඉදිකිරීම ආරම්භ කළ යුත්තේ යම් දිනකට පෙර ද ඒ දිනය වශයෙන් 1976 දෙසැම්බර් මස 31 වන දිනය වෙනුවට 1977 ජූනි මස 30 වන දිනය ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන් නිදහස් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස නිවාසය විකිණිය යුත්තේ යම් මිලකට නොවැඩිව ද ඒ මිල මෙන් ම, යම් මිලක් ඉක්ම වුවහොත් ආදායම් බද්දෙන් සියයට පණහකින් පමණක් නිදහස් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබෙන්නේ ද ඒ මිල ද වශයෙන් රුපියල් දසදහස වෙනුවට රුපියල් පහළොස් දහස ආදේශ කිරීමෙන්

සංශෝධනය කිරීම ය.

1 —ඒ 24259—7,024 (76/12)

එල්.ඩී.—ඕ. 52/76.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක     දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

2. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන නිවාස සංවර්ධකයන්ගේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

*ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 49 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(i) "1976 දෙසැම්බර් මස තිස් එක් වන දිනට පෙර" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1977 ජූනි මස තිස් වන දිනට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ වගන්තියේ "රුපියල් දස දහසක්" යන යෙදුම යෙදී ඇති කවර තැනක වුව ද ඒ වෙනුවට "රුපියල් පසළොස් දහසක්" යන යෙදුම ආදේශ කිරීමෙන්.

2—ජ 24259 (76/12)